# මැවීම ..................
# හෝ අහඹුව !

[CREATION OR CHANCE !]



විශ්වයේ විශ්මය මගින් මිනිස් වර්ගයා කෙරෙහි
දෙවියන්වහන්සේගේ අභිප්‍රාය
සාධනය කෙරේ.

# මැවීම හෝ අහඹුව!
# විශ්වයේ විශ්මය මගින් මිනිස්වර්ගයා කෙරෙහි දෙවියන්වහන්සේගේ අභිප්‍රාය සාධනය කෙරේ.

- "වැරැද්දට යොමුවූ ලෝකයක්"
- හේතුව පරිනාමවාදයයි
- මිනිසා කෙතරම් දක්ෂද?
- පරිනාමයේ දුෂ්ටකම
- මිනිසා අභ්‍යාවකාශය විනිවිද ගොස්ද?
- අගටුම්ට්ටෝ ඉහළ බැලූ විට!
- ආකාශයේ සලකුණු
- පරිනාමවාදියා මැසි-උගුලක පැටලේ!
- මිනිසා පිළිබඳ විශ්මය
- පරිනාමවාදියාහට මීමැස්සෙකු විදී!
- පරිනාමවාදියා දෙවියන්වහන්සේගේ ප්‍රඥාව එළිදරව් කරයි

අසීමිත අවකාශය, "පෘතුවිය" ලෙස අප හඳුන්වන මෙම සුවිසල් ගෝලය සහ එය මතුපිට ජීවිතයේ වික්ෂේපිත විවිධත්වය, අහඹුවකින් හෝ අනියම් ලෙස ඇතිවිද? ජීවිතයේ සංකීර්ණතාවයන් දෛවයේ සරල රැවියක් පමණක්ද--නැතිනම් පැවැත්ම පිටුපස යම් සැබෑ අභිප්‍රායක් තිබේද?

පසුගිය වසර අනූව තුළ ලෝකය මත්තෙහි සුවිසල් පරිවර්තනයක් පැමිණ ඇත. 1914 ට පෙර, ජීවිතයේ රිද්මය බෙහෝ විවේකී විය; මෝටර් රථ දුබල විය, අකාර්‍යක්ෂම විය; ගුවන්යානා අවිශ්වාසවූ ලෙහෙසියෙන් බිඳෙන සුලු ඒවා විය; විදුලිබලය තවමත් එහි ළදරු අවස්ථාවේ විය. සදාචාරාත්මකව ලෝකය තවමත් වික්ටෝරියානු යුගයේ ප්‍රමිති සහ චාරිත්‍ර මගින් පාලනය විය.

පළමු ලෝක යුද්ධය මහත් පරිවර්තන රැගෙන ආවේය. එය, මහත් නිර්මාණශීලී වකවානුවක් හඳුන්වා දුන්නේය. බයිබලයේ පුරෝකථනවල වදන්වලින් "දැනගැන්ම වැඩි විය" (දානියෙල් 12:4). වේගය පැමුණුනි: විදුලිබලයෙහි පාවිච්චිය සංවර්ධනය වුනි: ගුවන් විදුලිය සරල කෙළිබඩුවකට වැඩිදෙයක් වුනි. සටන් බිම්වලදී, ශක්තිමත් හමුදාවන්ගේ බිහිසුණු මරණීය අරගලය නිසා මිලියන ගණන් මියගියහ: මෙම ව්‍යාප්තවූ බලවත් විපත්තිය තුළ, චාරිත්‍ර සුළඟට විසි කරන ලද අතර නව ප්‍රමිති මගින් සදාචාරය මනිනු ලදහ.

තාක්ෂණයේ අපූර්ව සංවර්ධනයන් සහ තොරතුරු දැන්වීමේ බලපෑම පුලුල් වීම හේතුවෙන්, පරිනාමීය වාදයන් සහ "ස්වභාවික සංවර්ධනය" උපයෝජනය කරමින්, ජනතාව දෙවියන්වහන්සේගේ වැඩසිටීම සැක කරන්නට පටන් ගත්හ.

එක් අතකින්, තමන් ප්‍රබල බලයයන් පාලනය කරන බව දැනගත් මිනිසුන්, කලින් නොදැනසිටි අවකාශය විනිවිද යමින්, තමන් බොහෝ දුරට දෙවිවරුන් ලෙස උපකල්පනය කරගැනීමට සමත්වූහ. අනෙක් අතින්, මේ සා දරුණු විනාශයන් දුටු ඔවුන් හට ත්‍යාගශීලී සහ ප්‍රේමණීය මැවුම්කරුවෙකුගේ වැඩසිටීම සැකයේ හේතුවකට ලක්විය.

## වැරැද්දට යොමුවූ ලෝකයක්

දෙවියන්වහන්සේ ඉවත දමන ආකාරයේ ජීවිතය විස්තරකර දීමක් සහිත භෞතිකවාදී දර්ශනයක් මෑත කාලයේදී ප්‍රසිද්ධියට පත්විය. පරිනාමවාදය ගෙනහැර දැක්වූ එය, සංකීර්ණ විවිධත්වය සහිත මැවීම සම්භවය වූයේ අහඹුවකින් මිස, මනසෙහි පැහැදිළි අභිප්‍රායක් සහිත බුද්ධිමත් මැවුම්කරුවෙකුගේ අතින් නොවේ යැයි ප්‍රකාශකලේය. මහා යුද්ධ අණුසරනය කල අර්බුදයන් සහ අවපතන හරහා මිනිස්වර්ගයා අරගල කරන විට සහ පුවත් මාධ්‍ය තුළ පැහැදිළිව විදහා දැක්වූ හාමතට ලක්වූ ප්‍රදේශවල කාලකණ්ණිනම සහ හිඟභාවය දුටු විට, පරිනාමවාදයේ ප්‍රමිති දේශපාලනය තුළට

අවිචාරාත්මකව ඇතුල් කරන ලදහ. දෙවියන්වහන්සේ තුළ විශ්වාසය සහ ඇදහිල්ල තව දුරටත් අභියෝගයට ලක් කරමින්, කොමියුනිස්ට් වාදය ජනප්‍රියවූ අතර, විද්‍යාව සඳහා ඩාවින් කල දේ දේශපාලනය සඳහා කාල් මාක්ස් කලේ යැයි ප්‍රකාශකරන ලදහ. අද, දකුණේ සිට වම දක්වා දේශපාලනික චින්තන බොහොමයක් කොමියුනිස්ට් වාදයේ ප්‍රතිපත්ති වලින් වර්ණවත්වී ඇත්තේ බොහෝ රටවල දක්නට ලැබෙන රාජ්‍ය ඒකාධිපතිත්වය ප්‍රකාශකරමිනි.

මේ අතර, ආගම් තුළ මිනිස්වර්ගයාගේ විශ්වාසය සොලවනු ලැබිය. බයිබලයේ බලපෑම අවලව අවිශ්වාසයට ලක්වී පසුබිමට තල්ලුකරන ලදී. සදාචාරය සැහැල්ලුවට ලක්වී අද පතිව්‍රතාව "පැරණි මෝස්තරයක්" වී ඇත. ස්වර්ගීය පියෙකුගේ සංකල්පය අපැහැදිලි වූයෙන්, පෘතුවිය මත පිතෘභාවයේ ප්‍රතිපත්ති අභාවයට පත්විය. මුලු ලෝකයම දෙවියන්වහන්සේ කෙරෙහි අපචාරී වූයෙන්, තම උරුමයවූ දුක සහ දුෂ්ටභාවය සමග දික්කසාදය සහ අපචාරය වැඩුනි. අද, පොදුවේ මිනිස්වර්ගයා, දෙවියන්වහන්සේහට පිටුපා සිටී. එය සදාචාරාත්මකව කම්පිත තත්වයක ඇත. එය, වාර්ගිකව සහ ජාතිකව බොහෝ සෙයින් භයානක සහ ව්‍යාප්තවූ විනාශයන්ගේ අපේක්ෂාවන් හට මුහුණ දෙන්නේ ශිෂ්ඨාචාරයම සම්පූර්ණව විනාශකිරීමේ ප්‍රවනතාවයකිනි.

## හේතුව පරිනාමවාදයයි

පරිනාමවාදය හැර අන් කිසිම උගැන්වීමක් දෙවියන්වහන්සේ වැඩසිටිනා බවට මිනිසා තුළ ඇති විශ්වාසය විනාශකිරීමට දායකවී නොමැත. නමුත් එම න්‍යාය සම්පූර්ණයෙන්ම අසත්‍යවන අතර එය සත්‍යයැයි අවිවාදයෙන් සාධනය කලේ යැයි ප්‍රකාශකිරීමට නිර්භීතවන්නාවූ කිසිම කීර්තිමත් විද්‍යාඥයෙකු නොමැත. මෙම වාදයේ යෝජනා පාදකවී ඇත්තේ, සැබවින් විමසිලිමත් මනස තෘප්තිමත් කරන්නට අපොහොසත්, අනුමිතිය සහ අනියම් සාක්ෂි මතය. සමාජය මුහුණදෙන්නාවූ ජයගත නොහැකි ගැටළු සඳහා කිසිදු පිළිතුරක් මෙම වාදයට සැපයීමට නොහැකි අතර සදාචාරයේ

පිරිහීම, පවුල් ජීවිතයේ ගරාවැටීම සහ වර්තමාන ලෝකය අපකීර්තියට පත්කරන්නාවූ දේශපාලනික පසම්තුරුනා වලට එයම වගකිවයුතු වෙයි.

නමුත් කිසිම සැකයකින් තොරව, පුදුමාකාර ඉටුවීම්වලින් නිර්දෝශිවූ තම අපූර්ව පුරෝකථනවල ස්ථිර කිරීම සමග බයිබලයට, මිනිස් වර්ගයාගේ යහපත සපයන, අනාගතය සඳහා බලාපොරොත්තුව තබන තෘප්තිමත් ජීවිතයකට අප යොමු කල හැක. (1 තිමෝති 4:8).

මෙම සියලු ආරවුල්වල දැඩි වික්ෂිප්ත අංගය නම්, එහි උගැන්වීම් කෙතරම් ව්‍යාජදැයි වටහානොගත්, එහි බලපෑම කෙතරම් අන්තරාදායකදැයි නොදත් ජනතාව විසින්, රැවටි පරිනාමවාදය පිළිගැනීමයි. දැන් එය පාසැල්වල අධ්‍යාපන පද්ධතියට ඒකාබද්ධකොට ඇති අතර, සාධනය නොකල න්‍යායක්ව පවතිද්දීත්, බයිබලය මුලුමනින්ම අපකීර්තියට පත්කරන ආකාරයෙන් සියලු සැකයන්ගෙන් තොර යථක් ලෙස නිතර උගන්වනු ලැබේ.

එසේ, මුල් ළමාවියේ සිට, පසුගිය කාලවල ප්‍රතිපත්ති ප්‍රශ්නකිරීමටත්, එහි බලාපොරොත්තුවේ පණිවිඩය සහ පොද්ගලික ගැලවීමේ දීමනාව සමග බයිබලය කෙරෙහි උපහාසාත්මක වීමටත් ජනතාවට උගන්වනු ලැබේ. යේසුස්වහන්සේ නැවත මෙම පෘතුවියට පැමිණෙන අදහසත් (ක්‍රියා 1:11;3:19), තම උගැන්වීම් අනුසාරයෙන් ජීවත්වූ අය මළවුන්ගෙන් නැගිටුවා ඔවුන්හට සදාකාල ජීවිතය දෙන බවත් (මතෙව් 19:28-29) ජනතාව ප්‍රතික්ෂේප කරති; දෙවියන්වහන්සේ පෘතුවිය මතුපිට රාජ්‍යයක් ස්ථාපිත කරන බවත් (දානියෙල් 2:44) සහ එය මත්තෙහි රජු ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ රාජ්‍ය කරන බවත් (1 කොරින්ති 15:24; සෙකරියා 14:9) පෙන්වන ධර්මය ඔවුහු හාස්‍යයට ලක්කරත්. එසේ කරමින් ඔවුහු වැනසෙන මිනිස්වර්ගයා හට දෙවියන්වහන්සේගේ දීමනාව වන ගැළවීම (යොහන් 3:16) ප්‍රතික්ෂේප කරමින් අනාගතය තුළ ඇති කිසියම් බලාපොරොත්තුවකින් තමන් කපාහරී.

**මිනිසා කෙතරම් දක්ෂද?**

එසේ වුවත් බයිබලය විශ්වාසය අපේක්ෂාකරන අතර, මෙම භෞතිකවාදී යුගයේ, ජීවිතයේ බෙහෝ අභිරහස් ගවේශණය කල මිනිසා විශ්වාසයට උපහාස කිරීම ජනප්‍රියය. තමා එයට වඩා ඔබ්බට ගොස් ඇති බැව් මිනිසා උපකල්පනය කර ජීවිතයේ සියලු ගැටළුවලට පිළිතුරු තමා සතු බැව් සිතයි. නමුත් එවන් දෘශ්ඨියක් කෙතරම් දෝශසහිතද? මිනිසා මතුපිටින් දක්ෂවන්නට හැකි වුවත්, සියලු පිළිතුරු ඔහු සතුව නොමැත. සොයාගැනීම් මත්තෙහි පැකිලී වැටෙන්නට දෙවියන්වහන්සේ ඔහු හට අවසර දී තිබෙන ප්‍රමාණයට ඔහු දක්ෂවන්නට පුළුවන. සමහර මූලද්‍රව්‍ය පාවිච්චි කිරීමට එයින් ඔහුට හැක්වුවත්, ඒවායේ මූලයන් පිළිබඳව ඔහු අඥානව සිටී.

උදාහරණයක් ලෙස විදුලිබලය සලකන්න. ජීවිතයේ පදනම් සඳහා එය මත්තෙහි අප නිසැකවම යැපුනත්, එය යොදාගන්නා විද්‍යාඥයා හට එය කුමක්ද හෝ එය පැමිණියේ කොතැනින්ද කියා හෝ විස්තර කල නොහැකිය! නූතන යුගයේ තවත් විශ්මයක් සලකන්න: ගුවන්විදුලිය සහ වීඩියෝ ප්‍රක්ෂේපණය. එය සම්පූර්ණයෙන්ම යැපෙන්නේ මිනිසා සොයාගත්, නමුත් ඔහුට මැවිය නොහැකි මූලද්‍රව්‍යයන් මතය. කිසිම මිනිසෙකු ඉලෙක්ට්‍රෝනයක් හෝ ඉලෙක්ට්‍රෝඩ තනන ටංස්ටන් අංශුවක් හෝ කිසිදා සාදා නොමැත: වැල්ව ආවරණය කරන තඹ බිඳක් හෝ කිසිම මිනිසෙකු කිසිම දා මවා නොමැත. එසේ- මිනිසාගේ නිර්මාණාත්මක භාවයේ ජයග්‍රහණයසේ එළිදක්වන රේඩියෝව, ඔහුට හමුවූ නමුත්, ඔහු කිසිදිනෙක නොසෑදූ මූලද්‍රව්‍ය මත රඳාපවතී!

ඒවා එහි තැබුවේ කවරෙක්ද? දෙවියන්වහන්සේ මිස වෙන කවරෙක්ද?

දැන්, ඔබ ගැනම සිතන්න. සමහර විට දවසෙහි පැය අටක් ඔබ ඇඳක් මත විවේකීව නිඳ නිදන්නට උත්සාහ ගනී. ඇයි? නින්ද එතරම් අනිවාර්‍යය ඇයි? ඔබගේ දොස්තර මහතාගෙන් අසා, ඔහු එය

නොදන්නා බැව් සොයාගන්න! ඔබ එසේ කිරීම වැදගත් යැයි ඔහු දනී: එය, සම්පූර්ණ මිනිස් කය ප්‍රකෘර්තිමත් කර යලි ප්‍රාණවත් කරණ බවත්, එය ආහාර මෙන්ම වැදගත් බවත් ඔහු දනී. නමුත් සිරුර නිදාගතයුත්තේ මන්ද යන්න ඔබගේ දොස්තර මහතා නොදනී! ඔහුගේ සියලු ස්වයං ප්‍රකාශිත දැනුම සමග, මිනිසා බොහෝ සීමිතය.

මිනිසා කරන දේ විස්තර කිරීම සඳහා "ප්‍රාතිහාර්යය" නමැති වචනය අද නිතරම යොදා ගන්නා නමුත්, එය බයිබලය සම්බන්දව පාවිච්චිකිරීම ජනප්‍රිය නොවන වදනකි. හිසට ඉහලින් පියාසර කරන යෝධ ජෙට් යානාව "ප්‍රාතිහාර්යයක්" නමුත් බයිබලයේ සඳහන් ප්‍රාතිහාර්යයන් සඳහන් කිරීමේදී හඬනංවන සිනහවක් පිටවේ.

## පරිනාමයේ දුෂ්ඨකම

කලින් සඳහන් කලදේ සිත්හි තබාගෙන, පරිනාමවාදයේ න්‍යායය අවධානයෙන් සලකා බලන්න. "ජීවිතය" හුදෙක් අහඹුවකින් පැන නැගුනු බැව් එය පවසයි; සෑම දෙසින්ම පෙනෙන්නාවූ එහි සංකීර්ණ, සුංසංගතය සහ අසමාන ස්වරූපයන්, මඩ ගොහොරුවකින් වැඩුනු බවත්; කිසි මෙහෙයවීමක් හෝ අභිප්‍රායක් නොමැතිව වර්ධනයවූ බවත්; ඒ සියල්ල අන්ධ අහඹුවකින් සිදුවූ බවත්; අපට අත්, පාද සහ ඇස් ඇත්තේ අපූර්ව සරල වාසනාවකට බවත් එය ප්‍රකාශ කරයි!

එවන් න්‍යායක් විශ්වාසකිරීමට නොහැකිය. මම ඔරලෝසුවක් දෙස බලමි. එහි සියලු සංකීර්ණ යන්ත්‍ර පරීක්ෂාකරමි. එම කුඩා යන්ත්‍ර කොටස් සියල්ලෙහි කාර්යයන් මට නොවැටහුනද (මම යන්ත්‍ර සූත්‍ර පිළිබඳ නොදන්නෙමි), ඒ සියල්ලෙහි සැලැස්මක් සහ අභිප්‍රායක් ඇති බැව් මම දනිමි. නමුත් පරිනාමවාදයේ විද්‍යාව මට උගන්වන්නේ, ඔරලෝසුව තමන් විසින්ම නිපදවාගත් බවයි. එය නොදන්නා හේතුවක් නිසා එයට වේලාව ප්‍රකාශකරන්නට අවශ්‍යවූ බැවින් එම කුඩා දුනු සියල්ල පරිනාමය කරගත් බවත්, එමනිසා එයට පරිබාහිරව ක්‍රියාත්මකවූ බලයයන් සහ අභ්‍යන්තරයෙන් පැමිණි අපේක්ෂාව විසින්, එය අවසානයේදී ඔරලෝසුවක්වූ බවයි!

ඕනෑම විද්‍යාඥයෙකු දන්නා පරිදි, මාගේ කුඩා උපහාසය ඇදහිය නොහැක්කක් නොවේ. එම න්‍යායය පදනම්ව ඇත්තේ එම ප්‍රතිපත්තිය මතයි. ජීවිතය පැවැත්මට පැමිණියේ කෙසේද? දුරස්ථ අතීතයේදී, වෙරළ මත්තෙහි බලවත් ප්‍රථමික රැළි වැදී, ජීවිතය මැවුනු බැව් එක් මිනිසෙකු මා හට පැවසීය! නමුත්, බලවත් රැළි වෙරළ මත්තෙහි වදින්නට සැලැස්වූයේ කවුද? ඔහු දැන සිටියේ නැත. මා සිතන පරිදි, ඔහුගේ මුලු න්‍යායයම, ප්‍රාතිහාර්යය අඩවියෙන් ඔබ්බට ගොස් මැජික් රාජධානිය තුළට ගමන් කළේය! අන්ධ අහඹුව තම මැජික් දණ්ඩ සෙලවූ විට, ජීවිතය මැවුනි!

නමුත්, පළමුවැන්නා වැරදි බැව් තවත් විද්‍යාඥයෙකු මාහට පැවසීය! මෙම කරුණ පිළිබඳ පරීක්ෂා කිරීමේදී, විද්‍යාඥයන් සිදුකල බොහෝ වැරදි මාහට හමුවිය. විශේෂයෙන් මෙම පරිනාමවාදී න්‍යායය පිළිබඳ, එකක් අනෙක නිෂ්ප්‍රභා කරන්නාවූ බොහෝ පරස්පර න්‍යායයන් තිබූ බැවින්, තම නිවැරදි, පැහැදිලි සහ සරල උගැන්වීම් ඇති මගේ බයිබලය දෙස නැවත යන්නට මට හැකි විය: "පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූසේක"(උත්පත්ති 1:1).

නමුත් ඔබ සිහිතබා ගත යුත්තේ, මෙම දේවවිරෝධී න්‍යායයන් පාසැල් දරුවන්හට උගන්වන බවත්, දෙවියන්වහන්සේගේ වචනවලට අගෞරවයෙන් සැලකීමට උනන්දු කරවන ප්‍රතිපත්තිවලින් ඔවුන් අවිචාරවත්ව සකසන බවත්, අපචාරී දිවියක් කරා යා හැකි අධාත්මයක් ඔවුන් තුළ ආරෝපණය කරන බවත්ය.

දෙමාපියන්හට තම දරුවන් සඳහා දිය හැකි ශ්‍රේෂ්ඨතම උරුමය නම්, දෙවියන්වහන්සේ හට ගෞරව කිරීමත්, අධ්‍යාත්මික දේ පිළිබඳ අධ්‍යාපනයත්ය.

## මිනිසා අභ්‍යවකාශය විනිවිද ගොස්ද?

අසීමිත අවකාශයේ පාවෙන්නාවූ නොවැදගත්, ඉතාකුඩා අංශුවක් ලෙස, දුරේක්ෂය අපගේ පෘතුවිය එළිදරව් කරයි. ඔබ අහස දෙස

බැලුවිට, ඔබ මුහුණ දෙන්නේ අනන්තයටයි! අවකාශයට ඔබ්බෙන් ඇත්තේ කුමක්ද? එයටත් ඔබ්බේන් ඇත්තේ කුමක්ද? එසේ, මෙම ගැටළුව මත අප කල්පනා කිරීමේදී, මැරෙණසුලු මිනිසාට වඩා යම් දෙයක් ඇති බව අපට පසක් වන අතර, මැවුම්කාර දෙවියන්වහන්සේහා මුහුණට මුහුණ සිටීමට, අවකාශය දෙස බැලීම ප්‍රමාණවත්වේ.

අපගේ සමීපතම අසල්වැසියා (පෘතුවියේ උපග්‍රහයාවූ චන්ද්‍රයා හැරෙන්නට) වන්නේ සිකුරු ග්‍රහයායි. එය අප හට ආසන්නම ලක්‍ෂයේදී කිලෝමීටර් 39,000,000ක් එපිට දුරකින් ඇත. සිකුරු සහ අනෙකුත් ග්‍රහයන් සමග, කිලෝමීටර් 150,000,000ක් ඈතින්වූ සූර්‍ය්‍යයා වටා අපි පරිබ්‍රමණය වන්නෙමු.

සූර්‍ය්‍යයා, සෞරග්‍රහමණ්ඩලය නම්වූ තමාගේ කුඩා පද්ධතියක කේන්ද්‍රයයි. සෞරග්‍රහ මණ්ඩලයට ආසන්නම තාරකාවවූ (සෑම තාරකාවක්ම සූර්‍ය්‍යයෙකු නිසා, එය එහිම සෞරග්‍රහමණ්ඩලයේ කේන්ද්‍රයයි) ඇල්ෆා සෙන්චුරි පිහිටන්නේ කිලෝමීටර් මිලියන මිලියන 42ක් ඈතිනි.

සෞරග්‍රහමණ්ඩලය, රාත්‍රියේදී අප දකිනා අහස හරහා පැතිරුණු දැවැන්ත ක්‍ෂීරපතයෙහි ඉතා කුඩා තිතක් පමණක් වන්නේය. දකින්නාවූ සෑම ආලෝක තුඩක්ම (සූර්‍ය්‍යයා සමග සම්බන්ද ග්‍රහයන් කිහිපයක් හැරෙන්නට), අපගේ සූර්‍ය්‍යයා මෙන් තම දැවැන්ත පද්ධතිය පාලනය කරනා බලවත් සූර්‍ය්‍යයෙකි. අහස දෙස දුරේක්ෂයක් යොමු කරන්න. ඔබ පියවි ඇසින් දකිනා එක් ආලෝක තුඩත් සඳහාම ඔබ තවත් දහසක් දකිනු ඇත! මිනිසා විශාලතම දුරේක්ශ නිපදවන්නට නිපදවන්නට, ගවේශණයේ සීමාවක් නොමැති බැව් ඔහු වටහාගනී! ඔහු දෙවියන් සමග මුහුණට මුහුණලා සිටී.

කෙසේ වෙතත්, එය කෙතරම් විශ්මයජනක නිරවද්‍යතාවයකින් සහ සැලැස්මකින් පාලනය කරන්නේද යත්, මිනිසා මෙතෙක් නිපදවූ හොඳම ඔරලෝසුවට වඩා සූක්‍ෂමය, නිවැරදිය.

වාසනාව විසින් මේ සියල්ල සිදුකළේද? අන්ධ අහඹුව අපූර්ව සැලැස්ම නිපදවූයේද? මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමම එහි පිළිතුර වන්නේය!

අහස්ගැබ කෙතරම් ප්‍රබලද කිවහොත්, සාමාන්‍ය මැනීම් ක්‍රම නොසෑහෙන බැවින්, ආලෝකවර්ෂය නමින් තවත් ඒකකයක් මිනිසා තෝරාගෙන ඇත. තත්පරයකට කිලෝමීටර් 3000,000ක වේගයකින් ආලෝකය ගමන් කරයි. විනාඩියක් ඇතුළත දුර සඳහා එය 60න් ගුණ කර, පැයක් ඇතුලත දුර සඳහා නැවත 60න් ගුණ කර, දවසක් ඇතුලත දුර සඳහා නැවත 24න් ගුණ කර, සහ අවසානයේදී වසරක් තුළදී දුර සඳහා 365න් ගුණ කරන්න. එහි එකතුව කිලෝමීටර් මිලියන මිලියන දසයක් පමණවූ දැවැන්ත කෝටුවක්ය. අපගේ ආසන්නම තාරකාවවන ඇල්ෆා සෙන්චුරි, පෘතුවියේ සිට ආලෝක වර්ෂ හතරකුත් තුනෙන් එකක් දුරකින් පිහිටා ඇත! වෙනත් වචනවලින් කියන්නේ නම්, චන්ද්‍රයා මත ගොඩබෑ රොකට්ටු අපගේ ආසන්නම තාරකාව වෙත එල්ල කලේ නම්, එය කරා යෑමට ඒවාට වසර 5000ක් ගතවේ! මා සිතන පරිදි, එසේ සිදුවීමට බොහෝ කලකට පෙර, එය ගුවන්ගත කල අය තුළ එහි වර්ධනය කෙරෙහි අවධානය සිදී තිබෙනු ඇත!

නමුත් විද්‍යාඥයෝ "මිනිසාගේ අභ්‍යාවකාශය ජයගැනීම" පිළිබඳ මුබරී ලෙස කථාකරති!

තමා අවට ඇති මැවීම හා සසඳනවිට මිනිසා කෙතරම් අල්පද. යෝබ් සඳහා දෙවියන්වහන්සේ හට මෙසේ කිව හැකිව තිබිනः "පිරිවර සහිත මහවලසා ගෙනයන්ට නුඹට පුලුවන්ද?"(යෝබ් 38:32).

යටත් පිරිසෙයින් අපගේ සූර්‍යයාට වඩා මිලියනයක ප්‍රමාණයකින් විශාලවූ අහසෙහි මෙම යෝධයා, (සූර්‍යයා පෘතුවිය මෙන් මිලියනයකටත් වඩා විශාලය), පැයකට කිලෝමීටර් දහහතර ලක්ෂයකට අධික වේගයකින් තම "පිරිවර" හෝ පරිවාර ලෝකවල් සමග අභ්‍යාවකාශය සිසාරා පියාඹයි! අවකාශය හරහා මෙම වියරු දිවීමේදී "පිරිවර සමග මහවලසා ගෙනයන්නට" හැක්කේ

සර්වබලධාරී බලයට පමණි. ගීතාවලිය රචකයාගේ වදන් කෙතරම් සත්‍යයද: "ස්වකිය ඇඟලි වැඩයවු ඔබගේ අහස්තලයත් ඔබ පිහිටෙවු සඳ හා තාරකාත් බලා කල්පනා කරන කල, ඔබ මනුෂ්‍යයා සිහිකිරීමට ඔහු කවරෙක්ද?"(ගීතාවලිය 8:3-6)

නමුත් දෙවියන්වහන්සේ තම අපරිමිත දයාව හේතුකොටගෙන, තම මහිමය සඳහා කිහිපදෙනෙක් ගළවා ගැනීම උදෙසා, පියාණන් ලෙස තමන්වහන්සේ මනුෂ්‍යවර්ගයාහට එළිදරව් කොට, මෙම දැවැන්ත පරතරය යාකලසේක. (ගීතාවලිය 103:11-17 බලන්න).

අගුටුමිට්ටෝ ඉහල බැලූ විට!

මිනිසා ස්වර්ගය දෙස බැලූ විට, ඔහු මැවුම්කරුවාණන්ගේ මහිමයේ සහ විශ්මයේ යමක් දකී. දෙවියන්වහන්සේ, "පොළොව අවකාශයෙහි එල්ලා තබන" බැව් (යෝබ් 26:7) සහ "පෘතුවිචක්‍රය මතුයෙහි" (යෙසායා 40:22) වැඩසිටින බැව් බයිබලය විස්තර කරයි. ටොන් 6,000,000,000,000,000,000,000 ලෙස ගණන් බලා ඇති ගෝලයෙහි බරත්, එය තත්පරයකට කිලෝමීටර් 29.7 ක වේගයෙන් අවකාශය තුළට ප්‍රක්ෂේපණය කල දෙවියන්වහන්සේගේ බලවත් බලයත්, තම අභිරහස් ගුරුත්වාකර්ෂණ බලය විසින් එය ස්ථානගතකොට පවත්වාගෙන යෑමත් ඔබ කිසිවිටෙක සිතා බැලුවේද? මෙම වේගය හා සසඳන විට, වේගවත්ම බලවත්ම ජෙට් ගුවන් යානය එකතැන සිටින්නාසේ පෙනෙයි! අති ප්‍රබල ප්‍රවේගය සහිතව අවකාශය තුළ වේගයෙන් ගමන් ගන්නා එම දැවැන්ත ආකාශවස්තූන් පිළිබඳව අභිරහසද, පෘතුවියට සාපේක්ෂකව ඒවායේ පිහිටීම පිළිබඳ තාරකා විද්‍යාඥයන් හට අනාවැකි කිවහැකි නිවැරදිතාවයේ නීතිවලට යටත්වීමද ඔබ කල්පනා කලේද?

මෙම දැවැන්ත බලය සහ විශ්මය ජනක නිරවද්‍යතාවය මැවීමේ හෝ නැතහොත් අහඹුවේ සාක්ෂියක්ද?

පෘතුවිය අප්‍රමාණ වුවත්, එය සූර්‍යයාට සාපේක්ෂව කුඩාය. එය අප කෙරෙන් පිහිටි දැවැන්ත දුර නිසා, සූර්‍යයා අඳුරු විදුරුවක් තුළින්

බැලීමේදී, කුඩා රතු තැටියක් සේ පෙනෙයි. නමුත් ඇත්තවශයෙන්ම, එහි විෂ්කම්භය කිලෝමීටර් මිලියන එකහමාරක් පමණ වෙයි.

එහි කිරණ මත පොළොවෙහි ජීවිතය රඳාපවතිනා නිසා, සූර්‍ය්‍යයා ස්වභාව ධර්මයාගේ උදුන වේ. ආලෝක කිරණයක ගමන්මග තරම් වෙන කිසිවක් සිත්ගන්නා සුළු නොවේ. පළමුව, තත්පරයකට කිලෝමීටර් 300,000ක වේගයකින් අවකාශය හරහා එහි දිගු ගමන වෙයි. එය පෘතුවියට ලගාවී තණබිම් ස්නේහයෙන් පිරිමදී. සෑම තෘණ පත්‍රයක්ම එය ප්‍රීත්යෙන් වැළඳගන්නා අතර සූර්‍ය්‍ය උණුසුම එහි දුබල ඉන්ද්‍රියය තුළ සිරගතවෙනු ලබයි. තණබිම්හි සතුන් එම හරිත තෘණ කුට් දෙස වසගවන අතර, එසේ ඔවුන්ගේ ශරීර තුළට සූර්‍ය්‍ය කිරණ ඇතුල්වී, කිරි, මස් හෝ ලෝම ලෙස පරිවර්තනයවී අවසානයේදී ආහාර ලෙස අපගේ මේසය මත හෝ වස්ත්‍ර ලෙස අපගේ ශරීරය මත නිමාවට පත්වෙයි! තම කිරණ තුළ මිනිසා සඳහා ජීවය සපයන්නාවූ උත්කෘෂ්ඨ සූර්‍ය්‍යයා අප විසින් කෘතඥතාවයෙන් අගය කල හැකි අතර උන්වහන්සේගේ අපූර්ව සහ ත්‍යාගශීලී මැවීම කෙරෙහි ස්තුතිවන්ත වීමෙන් දෙවියන්වහන්සේගේ ඥානවන්ත භාවය සඳහා ප්‍රතිචාර දැක්විය හැකිය; එම අවස්ථාවේදීම, පරිනාමවාදියා ඔහුගේම මඩගොහොරුවේ අත්හැර දැමිය හැක (2 පේතෘස් 2: 22 බලන්න).

තම සෞඛ්‍යය සපයන කිරණ සහ අඳුර දුරුකිරීමේ හැකියාව ඇති සූර්‍ය්‍යයා, ,ලෝකයේ ආලෝකය, (යොහන් 8:12) ලෙස තමන් ප්‍රකාශකල ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සඳහා උචිත සංකේතයකි. උන්වහන්සේ තම කාරුණික බලපෑම යටතට පත්වූවන්ට ජීවිතය දෙනවා පමණක් නොව, මිනිස් වර්ගයා තිමිරයේ සිරකර සිටිනා ආත්මික අන්ධකාරය සහ අවිචාරලබ්ධිය අවසානයේදී විනාශකරනවාද ඇත. (යෙසායා 60:1-2).

පෘතුවිය මත පැමිණෙන උන්වහන්සේගේ රාජ්‍ය පිළිබඳ ගීතාවලිය කර්තෘ මෙසේ පැවසුවේය:
"හිරු පවත්නා තෙක් උන්වහන්සේගේ නාමය පවතින්නේය.

මනුෂයෝ උන්වහන්සේ කරණකොටගෙන ආශිර්වාද ලබන්නෝය. සියලු ජාතීහු උන්වහන්සේ වාසනාවන්තයයි කියන්නෝය" (ගීතාවලිය72:17).

අප ස්වර්ගය දෙස බලා, දෙවියන්වහන්සේ අවකාශය තුළට ප්‍රක්ෂේපණය කල දැවැන්ත බලයයන් දර්ශනය කල විට, පෘතුවිය තුළ තම ශ්‍රෙෂ්ඨ අභිප්‍රාය ක්‍රියාත්මක කිරීමේ හැකියාවේ සලකුණවු, උන්වහන්සේගේ බලයේ සලකුණු දකින්නෙමු: "ස්වර්ගයේ දෙවියන්වහන්සේ කිසිකලක නැතිනොවන්නාවූ ආජ්‍යයක් පිහිටුවනසේක. ඒකේ ආණ්ඩුව අන් සෙනගකට අත්හරිනු නොලබන්නේය. එය සියලු රාජ්‍යවල් පොඩිකර නැතිකරන්නේය. එයද සදාකාලෙටම පවතින්නේය"(දානියෙල් 2:44).

මෙම අභිප්‍රාය ඉෂ්ට කිරිම සඳහා, දෙවියන්වහන්සේ මෙම පෘතුවිය කරා නැවත යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එවනු ඇත (එළිදරව් 1:7).

ආකාශයේ සලකුණු
සූර්‍ය්‍යයාගේ මහත් ගිනි කිසිදා නොනිවෙනු ඇත. අංශක හයේ සිට හත්දහස දක්වා මතුපිට උෂ්ණත්වයකින් එය දැවෙන අතර අභ්‍යන්තර උෂ්ණත්වය අංශක මිලියන 50 ක් පමණවේ යැයි කල්පණාකරනු ලැබේ. මෙම නිෂ්පාදන ශක්තියෙන්, පෘතුවියට අල්ප ප්‍රමාණයක් පමණක් ලැබේ. පෘතුවිය සූර්‍ය්‍යයාට මදක් සමීප වූයේ නම්, එහි උෂ්ණත්වය අප විනාශකරනු ඇත. එය, චන්ද්‍රයා පෘතුවියට ආසන්න තරම් දුරකින් වූයේ නම්, පෘතුවිය සීදී බිදී යනු ඇත! නමුත්, එහි ජීවය රඳාපැවැත්වීමට ආධාරකයක් ලෙස, පෘතුවිය පවතින ස්ථානයේම පවතින්නට දෙවියන්වහන්සේගේ ඥාණවන්තභාවය සැලසුම් කලේය (යෙසායා 45:18).

දෙවියන්වහන්සේගේ නිර්මාණයන් හා සසදීමේදී, මිනිසාගේ ශ්‍රෙෂ්ඨතම නිර්මාණ නොවැදගත්ය. සිඩ්නි වරාය (ඔස්ට්‍රේලියාව) මත ඝනමිදුමක් පැවතියේයැයි උපකල්පනය කරන්නේ නම්, විස්ථාපනය කල යුතු වාතය ටොන් මිලියන පහකට වඩා අධිකවනු ඇත. එය විසිරවීම සඳහා උපක්‍රමයක් මිනිසාට නොමැත! නමුත්, කනස්සල්ලේ සහ අඳුරේ මහත් දුරලන්නාවූ සූර්‍ය්‍යයාහට, පැයක් ඇතුලතදී එම කාර්‍ය්‍යය කල හැක. සෑම විසිහතර පැයක් තුළදී අවතැන් කරවන

ඝනම්දුමින්, මෙය සුළුකොටසක් පමණය.

සූර්‍යයාගේ මහිමය බොහෝ තාරකාවිද්‍යාඥයෝ වර්ණනා කොට ඇත. පෘතුවිය ආලෝකවත් කිරීම සඳහා එය ආලෝකය සපයන බැවින්, එහි මතුපිට ප්‍රකාශගෝලය ලෙස නම් කෙරේ. සාමාන්‍ය තත්වයන් යටතේ, එය සතුව මෘදු පෘෂ්ඨයක් ඇතැයි පෙනෙන නමුදු, එහි මත විශාල රළ ඇති අතර, එය මහා ගිනි සාගරයයැයි විස්තර කොට ඇත. සැබවින්ම මහා ගිනි කුණාටුවන සූර්‍ය ලප ප්‍රකාශගෝලය මත දර්ශනය වන අතර, එම අවස්ථාවේදී දැවැන්ත ජලකර ගිනිදැල් කිලෝමීටර් 300,000 කට අධිකව පිටතට විහිදේ. සමහර ලප මායිම් ආසන්නයේ faculae ලෙස හැඳින්වෙන දීප්තිමත් වැටි ඇති අතර, ඒවා සූර්‍යයාගේ දීප්තිමත්ම කොටස් වන්නේය. සමහර අවස්ථාවන් වලදී ඒවා කි.මී. 65,000 ක් දිගින් සහ කි.ම. 6,500 ක් පළලින් යුක්තය. ප්‍රකාශගෝලයට පිටතින්, සිසිල් වායු අඩංගු ප්‍රතිවර්ත ස්තරය වෙයි. මෙයට ඉහලින් වර්ණගෝලය ඇති අතර, එහි රෝස පැහැති පෙනුම නිසා එය එසේ හැඳින්වේ. එය කි.මී. 6500 ක ගැඹුරකින් යුක්තය. මෙයට ඔබ්බෙන් අපූර්ව ස්වේත මහිමයවූ කොරෝනාව ඇත. එය විරලීකරණයවූ වායුගෝලයක්වන අතර එය තුළින් පීත්තපටි වන් දිගු, සිහින්, දීප්තිමත් සූත්‍රිකා මතුවේ. මේවායින් කිහිපයක් කි.මී. මිලියන දහසයක දිගින් විහිදී ඇත. 1878දී සිදුවූ පූර්ණ සූර්යග්‍රහණයේදී මේවා දුටහ.

ලෝකයට ජීවය ගෙනදෙන්නාවූ තම සාරවත් කිරණ ඇති සූර්‍යයා, අසම සම ශක්තිය සහ මහිමයෙන් යුත් මහත් ගිනි කබලක් ලෙසට බයිබලය සම කරයි ගීතාවලිය 19 දී, තම අණ ක්‍රියාත්මක කරන භට කණ්ඩායමක් විසින් වටකරනු ලැබූ හමුදා ප්‍රධානියෙකු ලෙස, දාවිත් සූර්‍යයා සමාන කළේය. එසේත් නැතිනම්, රැස්වූ සමූහය ඉදිරියේ මහිමයෙන් සහ තේජසින් දර්ශනයවූ මනාලයෙකුට සමකළේය. සූර්‍යයාගේ මහත් රශ්මිය, ආලෝකය සහ ශක්තිය, දාවිත්හට සිහිකළේ තරගයකට දුවන ශක්තිමත් මිනිසෙකුවන අතර පෘතුවියේ පැමිණෙන රජුවූ, තම බලාපොරොත්තු මධ්‍යගතවූ ක්‍රිස්තුස්වහන්සේගේ සංකේතයක් ලෙස ඔහු එය දුටුවේය. දාවිත් "දෙවියන්වහන්සේගේ හදවත සඳහාම මනුෂ්‍යයෙකු"වූ අතර, සදාකාලික වැදගත් පොරොන්දු දෙවියන්වහන්සේ ඔහුට දුන්සේක (2

සාමුවෙල් 7:12,13: යෙසායා 55:7). තම කෘතීන්හි එළිදරව්වන පරිදි මැවුම්කරුවාණන්ගේ සර්වබලධාරිත්වය සහ සර්වඥතා ඥානය පිළිබඳ භාවනා කිරීමට හෙතෙම ආශාකලේය. ඔහු මෙසේ ප්‍රකාශකලේය: "ස්වාමින්ගේ ක්‍රියා මහත්ය. ඒවාට ප්‍රියවන සියල්ලෝ ඒවා සොයා මෙනෙහි කරති"(ගීතාවලිය 11:2).


සූර්‍යයාගේ මහිමය, ශක්තිය, උණුසුම, එළිදරව්කරවන ආලෝකය, ආධිපත්‍ය බලය සහ ජීවය දෙන්නාවූ ලක්ෂණ ස්වාමිවූ යේසුස්වහන්සේගේ සංකේත ලෙස යොදාගැනේ. උන්වහන්සේ, "ධර්මිෂ්ඨකමේ සූර්යයා ස්වකීය පියාපත්වල සුවකිරීම් ඇතිව"(මලාකි 4:2) පෘතුවිය කරා පැමිණෙන ලෙස නියෝජනය කොට ඇත. උන්වහන්සේගේ මහිමය අලුත් යුගයක්, පෘතුවිය සඳහා "අලුත් දවසක්" අරඹන්නේ, රජුන්ගේ රජු ලෙස දේශපාලන අවකාශයේ බැබලෙන විටදීය. (2 සාමුවෙල් 23:4). උන්වහන්සේගේ ආධ්‍යාත්මික ආලෝකයේ කිරණ මෙම විදේශී රාත්‍රියෙහි තිමිරය සහ දුෂ්ඨභාවය විසිරුවා, දිව්‍යමය සත්‍යයෙන් ලෝකය බබලවනු ඇත (යෙසායා 60:1-3). තම අපේක්ෂිත මනාලිය කරා පැමිණෙන මනාලයෙකු සේ උන්වහන්සේ එන අතර (එළිදරව් 19:7) ඇය සංයුක්තවන්නේ උන්වහන්සේගේ පැමිණීමේ බලාපොරොත්තුවෙන් තම ශික්ෂා අනුව ජීවත් වීමට අවංකව උත්සාහකල අයගෙන්ය; ඇය උන්වහන්සේ සමග අමරණීයත්වයෙන් ඒකාබද්ධව මහිමාන්විත ඒකත්වයෙන් පෘතුවිය මත ජීවත්වෙමින් රාජ්‍ය කරනු ඇත (එළිදරව් 5:9-10; යොහන් 17:20-21).

උන්වහන්සේ සියලු රජවරුන් පහලට ඇද දමා, ධර්මිෂ්ඨභාවයෙන් පෘතුවිය මතුයෙහි රාජ්‍ය කරන බැවින් (දානියෙල් 7:27), ක්‍රිස්තුස්වහන්සේ ,තමාගේ ගමන දුවන්නට ශක්තිමත් කෙනෙකු, වෙනු ඇත (ගීතාවලිය 19:5). ,සේවය නොකරන ජාතියද රාජ්‍යයද නැතිවන, බැවින් (යෙසායා 60:12), සියලු මිනිසුන් උන්වහන්සේ ප්‍රශංසා කරනු ඇත. තම අධ්‍යාත්මික ආලෝකය සහ වටහාගැනීමේ දීප්තියෙන්, වර්තමානයේ මිනිස්වර්ගයා වටලා ඇති ඝන මීදුම සහ ,දැඩි අඳුර, විසිරුවාහරින ලබනු ඇත. තම දිව්‍යමය සත්‍යයේ එළිදරව්ව නිසා මෙසේ කැගැසීමට මිනිසා බලකරන ලබනු ඇත: ,කිසි ප්‍රයෝජනයක් නැති නිශ්ඵලකම වන බොරුකාරකමම අපේ පියවරු

(අධ්‍යාත්මික, දේශපාලනික සහ විද්‍යාත්මක!) උරුමකරගෙන සිටියෝය" (යෙරමියා 16: 19).

පරිණාමවාදියා මැසි-උගුලක පැටලේ !
සරලව ඉදිරිපත් කරන්නේ නම්, නිශ්චිත මැවීමකට වඩා ස්වාභාවික ක්‍රියාවලිය විසින් සරල ආකෘතියේ සිට අලුත් සහ සංකීර්ණ ආකෘති වලට ජීවය සංවර්ධනය වීම පරිණාමය ලෙස නිර්වචනය කල හැකිය. එසේ ස්වාභාවධර්මය දෙවියන්වහන්සේ වෙනුවට ආදේශකල අතර පෘතුවිය මත ජීවයේ සියලු අපූර්ව විවිධත්වය උන්වහන්සේගේ පුදුමාකාර මැවීමේ බලය පිළිබඳ ප්‍රකාශ නොකරන බවත්, ඒවා අහඹුවේ අපූර්ව විපර්යාස බවත් පරිණාමවාදියෝ ප්‍රකාශකරත් !

A පුෂ්පය.
B ශාකය.
C,D,E ක්‍රියාකාරී උගුල.
1. කෙලවර උගුල සහිත රොසෙට්ටුවේ පත්‍ර.
2. උගුල.
3. පත්‍රය මත මැස්සා.
4. උගුල ක්‍රියාත්මක කරන ස්පර්ශකෙඳි: වැසීමේ යාන්ත්‍රනය
5. උගුල වසන දත්.




මෙම උගැන්වීම් කෙතරම් අසම්මත දැයි බැලීම සඳහා, අමෙරිකා එක්සත් ජනපදයෙහි, උතුරු කැරොලයිනාවේ හමුවන කෘමි භක්ෂක පැලෑටියවූ "වීනස් මැසි උගුල" නම් දෙවියන්වහන්සේගේ නිර්මාණය අවධානයෙන් පරීක්ෂාකරන්න. මෙය ඥාණාන්විත මැවුම්කරුවෙකුගේ අපූර්ව නිර්මාණයක සාක්ෂියක්ද එසේ නැතිනම් පුදුමාකාර වාසනාවක් තුළින් ක්‍රියාකරන අන්ධ අහඹුවදැයි කල්පනාකරන්න!

මේ සමග ඇති චිත්‍රවල, මලෙහි විවිධ කොටස් හඳුනාගෙන, උගුල ක්‍රියාකරන ආකාරය කල්පනා කරන්න. පැලෑටියේ පත්‍ර "රොසෙට්ටුවක" ආකාරයෙන් (B1 චිත්‍රය) පොළොවෙහි වැතිරී ඇත. සෑම පත්‍රයක්ම වාගේ උගුලක්සේ පෙනෙන සහ ක්‍රියාකරන පත්‍ර

තලයකින් කෙලවරවේ. උගුලේ කොටස් දෙක මැදින් සම්බන්ධවී ඇති අතර රෝස වර්ණයෙන්, රතෙන් හෝ හරිතයෙන් වර්ණවත් වී පුෂ්පයක්සේ ආකාර්ෂණාත්මකව ඇත. නමුත්, එක් එක් උගුල සඳහා ට්‍රිගරයන් හයක් වන ලෙස උගුලේ අභ්‍යන්තර මුදුන් පෘෂ්ඨයේ කුඩා "ට්‍රිගරයන්" තුනත් ඇත (සංවේදී කෙඳි-C4 චිත්‍රය බලන්න).

මෙම උගුල් මත ගොඩබසින කෘමීන් පැණි සොයමින් ඒවටා ඇවිදිති. උගුල මත ඇති සංවේදී කෙඳි කෘමියෙකු විසින් කැළඹූ විට, දැතිවත් දාර ක්ෂණිකව වැසී, බේරියාමට ඉඩක් නොදේ. (E චිත්‍රය බලන්න). මෙම සංවේදී කෙඳි හය පීවි හෝ මියගිය දෙයක් අතර වෙනසද හඳුනාගනී. මක්නිසාද, එකවිට කෙඳි දෙකක් ස්පර්ශ වුවහොත් හෝ එකම කෙන්ද දෙවරක් ස්පර්ශවුවහොත් හෝ මිස උගුල නොවැසෙයි. කුඩා දඬු කැබලි හෝ ගල් කැට උගුල ක්‍රියාත්මක නොකරයි!

එය වැසුනු විට, උගුල ක්‍රමිකව තව තවත් තදවී, උගුලේ අභ්‍යන්තර පෘෂ්ඨයේ ඇති පීර්ණ ග්‍රන්ථි මත ගොදුර මිරිකාගනී. මෘදු ශරීර පොඩිකර දැම්මට මෙම උගුල් ශක්තිමත් වන අතර, අසුවූ ඕනෑම කෘමියෙකු පීර්ණ කිරීමට හැකි අම්ලයක් එම ග්‍රන්ථි ස්‍රාවය කරයි.

ගොදුරක් අසුවූ විට සතියක් පුරා අම්ලය නොකඩවා සැපයීමට ග්‍රන්ථිවලට හැකිය. උගුල වැසුනු විට, එය "ආමාශයක්" ලෙසට පරිවර්තනය වන ක්‍රියාදාමය ආරම්භවේ.

එහි බොහෝ උගුල් සමග මෙම ශාකය, සහයෝගීතා අනුපිළිවෙලට එකගතාවයෙන් ක්‍රියාකිරීමට නිර්මාණයවී ඇත. මෙය ප්‍රත්‍යක්ෂවම ඥාණවන්ත මැවුම්කරුවෙකුගේ බුද්ධිමත් නිර්මාණයකි.

උගුලේ විවිධ කොටස්වූ පත්‍ර දෙක, ඒවාගේ ඇමුණුම, දැති සහිත දාර, "ට්‍රිගර්" කෙඳි, පීර්ණ ග්‍රන්ථි, නිවැරදි අවස්ථාවේදී ශ්‍රාවය වන සාරවත් අම්ලය පිළිබඳ නැවත කල්පනා කර බලන්න. ගුණවත් නිර්මාණයකට හැර එවැනි ක්‍රමික සකස් කිරීමක් අක්‍රමික අහඹුවක් කෙසේ නිපදවන්නේද? එය විය නොහැකිය. විනස් මැසි උගුල පරිනාමය වුයේ කෙසේදැයි පෙන්වීමට උත්සාහ ගැනීමෙන්, පරිනාම

වාදය විකාරයක් ලෙස එළිදරව් වෙයි. ඇත්ත වශයෙන්ම, එසේ කිරීමට උත්සාහ දැරීමේදී, පරිනාමවාදියාම මැසි උගුලේ හසුවේ!

විකල්පය පිළිබඳ සිතන්න. උගුලේ කොටස් එක්කෝ වසර මිලියන ගණනාවක් තුළ එකින් එක "පරිනාමය" වූවාය, නැතහොත් දෙවියන්වහන්සේ ශාකය මැවූසේක! එම උගුල පරිනාමය වන්නට වසර මිලියන ගණනාවක් ගතවූ බැව් පරිනාමවාදියා ප්‍රකාශකරන්නාවූ නමුත්, සම්පූර්ණ පැලෑටිය නිමවූ පසු මිස එය ක්‍රියාත්මක නොවේ! භාග්‍යයකට එම පැලෑටියට මොළයක් නොමැත. නැතිනම් ඉච්ඡාභංගත්වය තුළින් එය තමන්වම විනාශකරගනු ඇත! නමුත් පෙනිමට එය මොළය නොමැතිවත්, පරිනාමවාදියාට අනුව, වසර මිලියන ගණනාවක් තුළ එය පරිනාමයේ නිමග්නවී, නොහැකියාව කිරීමට උත්සාහ දරමින්, අසම්පූර්ණ උගුලක් ක්‍රියාත්මක කිරීමට යත්න දරමින්, එක්තරා උපකල්පිත අවස්ථාවකදී එක්තරා නුවණැති පැළෑටියක් අධිමිනිස් බලයකින් ("ප්‍රාතිහාර්යය" නමැති වචනය අපි නොයොදන්නෙමු) අවශ්‍යය කුමක්දැයි සැනෙකින් සිතා බලා (මොළයක් නොමැතිව) එය සංවර්ධනය කිරීමට ආරම්භ කළේය!

අපගේ විස්තර කිරීම තුළ ඇති උපහාසය පිළිබඳ කරුණාකර සමාවන්න. නමුත් එසේ නොවී මෙම පුදුමාකාර පැලෑටිය පිළිබඳ පරිනාමවාදියා හේතු දක්වන්නේ කෙසේද!"මෙම පැලෑටිය පැවැත්මට පැමිණිය හැක්කේ එකම මාර්ගයකිනි: නිශ්චිත මැවීම මගිනි.

එදෙස නැවත බලන්න. පත්‍රය කෙළවර පිහිටි උගුලෙන් පුෂ්පය අසම්බන්දව ඇති බැව් නිරීක්ෂණය කරන්න. බීජය තුළට පිටපත් වූවා නම් මිස, පත්‍රවල කුමන හෝ හැඩයේ වෙනස්වීමක් තම දාරකයා හට උරුමය කිරීමට නොහැකිය. පුෂ්පයට පමණක් මෙය කළ හැකිද? සත්තකින්ම නොහැකිය! පරිනාමවාදියාට ඇති විකල්පය නම්, බීජය තුළදීම පරිනාමය ක්‍රියාත්මක වන බැව් උපකල්පනය කිරීමයි.

ඊනියා විද්‍යාඥයන් ඔබට විශ්වාස කිරීමට යැයි කියන්නේ කුමක්දැයි

දැන් සිතා බලන්න. සියලු ක්‍රියා සහිත මෙම සංකීර්ණ කෘමි උගුල, බීජය සංවර්ධනයවූ පියවි ඇසට නොපෙනෙන සෛලය තුළ ඇතිවූ "වෙනස්කම්" වල ප්‍රතිපලයක් ලෙසත්, පරිනාමීය යුගයේදී මෙම වෙනස්වීම් නොවැදගත්වූ බවත් (උගුල ක්‍රියා නොකරන බැවින්), එමනිසා ඒවා "පරිනාමය" වුයේ පැහැදිළි හේතුවකට නොවන බවත් පිළිගන්නට ඔවුන් ඔබගෙන් ඉල්ලා සිටී!

සෛලයම සෑදී ඇත්තේ බොහෝ සංකීර්ණ කොටස් සහ පදාර්ථවලින් වන අතර වර්ණදේහ සහ ජාන වඩාත්ම විස්මවනය. වර්ණදේහ වනාහි පෝටීන සහ න්‍යෂ්ටිය අම්ලවලින් සෑදී ක්ෂුද්‍ර පීත්ත පටි වන අතර වැඩීම සහ ප්‍රවේණිය සඳහා අණාදී, පූර්ණ ශාකයේ හැඩය සහ ක්‍රියාව තීරණ කරයි.

එය අවට සිටින්නාවූ කෘමීන් හෝ කුඩා ජීවීන් ග්‍රහණය කර ගැනීම අරමුණු කරගත් එක් එක් පත්‍රය කෙලවර "විනස් මැසි උගුලක්" නිර්මාණය වීම සඳහා සෛලය මිලියන ගණනක් වාර තමන් ප්‍රජනනය කිරීමේදී, ප්‍රෝටීනවලින් සෑදී එම ක්ෂුද්‍ර පීත්ත පටි වලට බලපෑම සඳහා තම ද්‍රව නොනවතින ප්‍රචණ්ඩ අවස්ථාවක තබා ගැනීම උදෙසා සෛලයක් තුළ ක්‍රියා කල හැකි "ස්වාභාවික බලයයන්" මොනවාද?

පැහැදිළිවම පරිනාමීය න්‍යායය තර්කය සහ සත්‍යය අනවශ්‍යසේ ඉවත්කොට, අසම්මතය ආදේශකරයි; නමුත් වඩා බරබතල ලෙස, එය අප අවට ඇති අපූර්ව ජීව වස්තූන් සඳහා මැවුම්කරුවෙකුගේ අවශ්‍යතාවය ඉවත්කොට, සෑම පැවැත්මක්ම "ස්වාභාවික හේතුන්"ගේ ප්‍රතිපලයක් ලෙස විස්තර කිරීමට යත්න දරයි.

නමුත්, පුද්ගලයෝ තුළ විපර්යාස පරිසරයේ විවිධත්වය තුළින් රැගෙන එන බැව් තර්ක කල හැකිය. දෙමුහුන් කිරීම තුළින් වඩා හොඳ සතුන් ඇති නොවේද? එය එසේ වන්නට හැකි වුවද, එයට බැටළුවෙකු අශ්වයෙකු කිරීමට නොහැකි අතර පරිනාමය සැබැවින්ම ප්‍රකාශ කරන්නේ එයයි. දෙමුහුන් කරන ලද සත්වයා එසේම ඉන්නට

හැරීමෙන් සිදුවන්නේ කුමක්ද? සෑම බෝකරන්නේකුම දන්න පරිදි, ඌ නැවත තම වර්ගයා බවට ආපසු හැරේ.

## මිනිසා පිළිබඳ විශ්මය

මිනිස් ශරීරය අපූර්ව සහ ඉතා සංකීර්ණ ජීව යන්ත්‍රයකි. හදවත, රුධිරවාහිනී පද්ධතිය, පෙනහලු, ආදිය ජීවියාගේ ජීවිතය පවත්වාගෙන යාම සඳහා දැඩි සහ නිරන්තර ක්‍රියාවලියක යෙදෙන අතර, මෙය කෙතරම් පුදුමාකාර ලෙස කෙරේද යත්, කිසියම් අපිළිවෙලක් හෝ අනතුරකින් ඒබැව් නොහැගෙන්නට, ඒ පිළිබඳව අප සම්පූර්ණයෙන්ම විසංඥය.

මේ සියල්ල මඩගොහොරුවක ක්‍රියාත්මකවූ අහඹුවක ප්‍රතිපලයද? දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා මිනිසා සෑදූ බවත්, තමන්වහන්සේගේ මහිමය පිළිබිඹු කිරීම සඳහා බුද්ධිය දෙන ලද බවත් බයිබලය උගන්වයි. අභාග්‍යයකට, එම බුද්ධියම අණුවනකමේ සහ මෝඩත්වයේ හේතු සඳහා වෛශ්‍යාචාරියේ යොදවත්.

ශරීරයේ අපූර්ව යන්ත්‍රණයට උදාහරණයක් ලෙස, ඇස මගින් ශරීරය තුළට ගන්නා ආලෝකයේ පුදුමය සලකා බලන්න. ආලෝකය, සූර්‍යයා වැනි දීප්තිමත් වස්තූන්ගෙන් ආරම්භවන තරංග සංචලන දාමයක් බැව් විද්‍යාව පවසන අතර එය ආලෝකයේ දිශාවට සෘජු කෝණිකව සිරස් අතට කම්පනය වෙයි. ආලොකය විවිධ තරංගවල සංකලනයක්වන අතර වැටෙන වැස්ස මත පරාවර්තනය වන සූර්‍යාලෝකයෙන් සෑදෙන දේදුන්නේ එහි වර්ණ පෙන්වයි. නිශ්චිත වර්ණය හෝ පැහැය අණුව මෙම තරංග ප්‍රමාණය වෙනස්වන නමුත් ඒවා මිලිමීටරයකින් 0.00042 ක පමණ ප්‍රමාණයකින් මධ්‍යවේ.

ඇස තුළින් දකින ආලෝකයේ සහ වර්ණයේ අලංකාරය අප අගය කරන අතර, එසේ හැකිවී ඇත්තේ ඇසෙහි පිටුපස කොටසෙහි විසිරී ඇති දෘෂ්ටික ස්නායු කෙඳිවල ප්‍රසාරණයක්වූ රෙටිනාව (දෘෂ්ටිවිතානය) නම්වූ සංවේදී පටලය නිසාය. එය මිලිමීටර 0.3175 ක් පමණ ඝණවූ නමුත්, එකක් මිලිමීටර් 0.03175 ක් ඝණවූ වෙනස්

ස්වර දහයකින් සෑදී ඇත. ආලෝකය තත්පරයකට කිලෝමීටර් 300,000 ක වේගයෙන් ගමන් කරන බැවින්, අප දම්පැහැති මලක් දෙස බලන විට (දම්පැහැති තරංග කෙටිම ඒවා බැවින්), රෙටිනාව තත්පරයකට 750,000,000,000,000 කවැනි ප්‍රබල ශීඝ්‍රතාවයකින් කම්පනය වන බැව් නිශ්චය කිරීම සරල ගණිතමය ගණනයකි!

මැවුම්කරුවාණන් පිළිබඳව ගීතාවලිය කර්තෘ මෙසේ පැවසීම පුදුමයක් නොවේ: "මම ඔබට ස්තුතිකරන්නෙමි; මක්නිසාද මම භයානක ලෙසත් පුදුම ලෙසත් සාදන ලද්දෙමි. ඔබගේ කාර්මාණ්ත ආශ්චර්යමත්ය; මාගේ ආත්මයද ඒ බව මනාකොට දනියි" (ගීතාවලිය 139:14). ඇසෙහි රෙටිනාවේ විශ්මය තුළ, ඔරලෝසුවක යන්ත්‍රණයට වඩා බිලියන 750ස් වාරයක් වඩා සූක්ෂම ජීව් ද්‍රව්‍යයක් මවන ලද, මැවුම්නරුවාණන්ගේ අනන්ත බලයෙහි උදාහරණයක් අපට ඇත. තත්පරයක් තුළ රෙටිනාව කම්පනයවන වාර ගණන සඳහා ඔරලෝසුව වසර 22 කට වඩා කලක් ස්පන්දනය විය යුතුය. නමුත් මනුෂ්‍යයා, දිව්‍යමය සහ ඥාණාන්විත මැවුම්කරුවෙකුගේ ඇඹීම නොව, අහඹුවේ අපූර්වත්වයට ස්මාරකයක් යැයි "අඥානයා කිය" (ගීතාවලිය 14:1).


## පරිනාමවාදියාහට මීමැස්සෙකු විදී!

මීවදයක බහුලව ඇති විශ්මිත ඉටිසෙල බලන්න. එක් එක් සෙලයක්ම වැරදීමකින් තොරව සහජාසය මගින් මීමැස්සා සාදන පරිපූර්ණ ෂඩාස්‍රයකි. ඔබ එය සෑදීමට උත්සාහ කරන්න! කෝදුවක්, කොණමාණයක්, හෝ විහිත චතුරස්‍රයක් නොමැතිව පරිපූර්ණව ෂඩශ්‍රයක් ඇඳීමට යත්න දරන්න. එය කල නොහැකි බැව් ඔබ සොයාගනු ඇත! නමුත් මීමැස්සා එය කරයි! කෙසේද?

තවදුරටත්, සෑම මීවදයකම සෛල කාණ්ඩ දෙකක් අඩංගු අතර, එකිනෙක දෙපැත්තට මුහුණලා විව්‍යූතව ඇත. එසේ වුවද, එක් පැත්තක සෛල අනෙක් පැත්තේ සෛලවලට නිශ්චිතවම විරුද්ධ පැත්තේ නොපිහිටයි. මක්නිසාද, එක් එක් සෛලයක මාධ්‍යය, විරුද්ධ පැත්තේ ඇති සෛල තුනෙහි බිත්ති හමුවන ලක්ෂයට යාව් ඇත.

එසේ, සෛල වෙන් කරනා බිත්තිය බොහෝ ශක්තිමත් කර ඇත. මෙම බිත්ති පැතලි නොවේ. නමුත් එහි, නිශ්චිත කෝණයකට එකිනෙක හමුවන ස්තර තුනක් අඩංගුව ඇති අතර එමගින් සෛලයේ මධ්‍යය එහි ගැඹුරුම කොටස කරයි.

මීමැස්සන් සාදන කෝණයන් අංශක 109.28 සහ 70.32 වශයෙන් බැව් මැනිම මගින් ස්ථිරකොට ඇත. එවන් කාර්‍යයක් සඳහා යහපත්ම කෝණ විය යුත්තේ 109.26 සහ 70.34 බැව්, දැඩි සංකීර්ණ ගණනයක් මගින් ගණිතඥකොනින් තීරණය කලේය. වෙනත් වචනවලින් කිවහොත්, ගණිතඥයන් සහ මීමැස්සන් වෙනස් වූයේ කුඩා ප්‍රභේදයක්වූ අංශකයන් කළා දෙකක හෝ වෘත්තයකින් 1/10,800 ක කොටසකිනි. මීමැසි සෛලයක් වැනි කුඩා දෙයක් සඳහා එය අල්පිෂ්ට අවකාශයකි.



මෙවන් ක්ෂුද්‍ර කොටසකින් මීමැස්සෝ දෝෂසහගත විද? නැතහොත් ජ්‍යාමිතිකඥයෝ වැරදිවුවෝද? පසු කියැවූ දේ නිවැරදි බැව් පසුව ඔප්පුවුනි. මෙම පහදාදීම පිළිබඳ තෘප්තිමත් නොවූ ස්කොට්ලන්ත ජාතික ගණිතඥයාවූ මැක්ලෝරින්, මෙම ගැටළුව පිළිබඳ අලුත් සහ අවධාන පරීක්ෂණයකට තමා යොමුකලේය. ලඝුගණක වගුවල සුළු මුද්‍රණ දෝෂයක් නිසා, අංශකයකින් කළා දෙකක නිශ්චිත ප්‍රමාණයකින් පළමුව ලබාගත් ප්‍රතිපලය වැරදි බැව් ඔහු පෙන්විය! එසේ, මීමැස්සෝ නිවැරදිවූ අතර ගණිතඥයෝ වැරදි වූහ!

මීමැස්සන්ගේ ඥානය පැමිණියේ කොතැනින්ද? මෙම කුඩා ජීවින්ගෙන් නිහඬකරනු ලැබූ ඩාවින් පවා මෙසේ කිවේය, "මීමැස්සන් පිළිබඳ අපි කුමක් කියන්නෙමුද...?"

සැබැවින්ම කුමක් කියන්නෙමුද! පරිපූර්ණ ෂඩස්‍රයන් ලෙස තම

සෙල සාදාගැනීමටද, ගේ කුරුල්ලන් පිදුරුවලින් තම කූඩු සාදාගැනීමටද, බීවරයා අමුණු සාදාගැනීමටද, හාවුන් පොළොවෙහි වලවල්වල ලගින්නටද හේතු කාරකවූ විශේෂිත සහජාසයන්, මේ සියල්ල වෙනස්වූ වර්ග පිළිබඳ මැවීමේ සාධනයයි: ඥානවන්ත සැලැස්මක් අනුව ක්‍රියාකරන අනන්ත මැවුම්කරුවෙකුගේ වැඩසිටීම සඳහා නිහඬ සාක්ෂිය.

## පරිනාමවාදියා දෙවියන්වහන්සේගේ ප්‍රඥාව එළිදරව්කරයි.

නොදැනුවත්වම දෙවියන්වහන්සේගේ අපූර්ව පූර්වඥානය සහ ප්‍රඥාවන්ත භාවය පිළිබඳ පරිනාමවාදියා තම සාක්ෂි සපයයි. මක්නිසාද යත්, අන්තිමයේ දවස්වල ඔහුගේ න්‍යායයේ වැඩීම සහ බලපෑම පිළිබඳ දෙවියන්වහන්සේගේ වචන තුළ පැහැදිළිව අනාවැකි පවසා ඇති බැවිනි. බයිබලය මෙසේ ප්‍රකාශකරයි: "අන්තිම දවස්වලදී තමුන්ගේ තෘෂ්ණාව ලෙස හැසිරෙන්නාවූ, උන්වහන්සේගේ ඊමේ පොරොන්දුව කොතැන්හිදැයි සරදම් කරමින් කියන්නාවූ කවටකම් කරන්නෝ පැමිණෙන්නෝයයි පළමුකොට දැනගනිල්ලා. මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය කරණකොටගෙන පුරානයේ පටන් අහසත්ද...පොළොවක්ද තිබුනු බවත්...ඔවුනු කැමැත්තෙන්ම මතකනැති කරති."(2 පේතෘස් 3:4-5)

"අන්තිමයේ දවස්වල" මිනිසුන් මැවීමේ සත්‍යයන් "කැමැත්තෙන්ම මතකනැති කරන" බැව් පැහැදිළිව පවසන බයිබල් පුරෝකථනයක් මෙන්න. එයට විරුද්ධව ගෙනහැර දැක්විය හැකි සාක්ෂි වලට එරෙහිව පරිනාමවාදයේ ව්‍යාප්ත උගැන්වීම, මෙම අනාවැකිය සම්පූර්ණ වීමකි. වර්ථමානයේ ප්‍රත්‍යක්ෂව පෙනෙන ප්‍රවනතාවයම දෙවියන්වහන්සේ අනාවැකි පැවසීම අපූර්ව දෙයක් නොවන්නේද? පෘතුවිය මත තම රාජ්‍යය පිහිටුවීම සඳහා ක්‍රිස්තුස්වහන්සේගේ පැමිනීමට පෙර "අන්තිමයේ දවස්වල" ලක්ෂණයක් ලෙස ඇතිවන සදාචාරාත්මක පිරිහියායම සඳහා මෙම වාදය වගකිවයුතු බැව් ශුද්ධලියවිලි පෙන්වයි. එසේ, පරිනාමය මිත්‍යාවේ ව්‍යාප්ත අන්ධ පිළිගැනීම සැලකිය යුතු "කාලයන්හි සලකුණකි".
පරිනාමවාදය වැනි දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කරන්නාවූ

ධර්මයකට හිස නැමීම ප්‍රතික්ෂේප කොට, බයිබලයේ නිසැක, අවවාදාත්මක වදන් වලට අපි කීකරුවිය යුතු වෙමු. එය ඊනියා උගත් මිනිසුන්ගේ ප්‍රකාශවලට එරෙහිව, සත්‍යය සේ සාධනය නොකළහැකි මායා පරිකල්පිත අඩවිවල පිහිටන්නාවූ එකකි.

ඉහල ස්වර්ගයේ හෝ පහළ පෘතුවිය මත හෝ දර්ශනය වන්නාවූ මැවීමේ ආශ්චර්යයන් ජනතාව සැලකිල්ලට ගත්තාවේ. මැවුම්කරුවාණන්ගේ ඥානවන්ත භාවය පිළිබඳ මහිමයේ සංකේත මෙතැනදී ක්ෂණිකව හඳුනාගත හැකිය. බයිබලය අවධානයෙන් කියැවීම තුළින්, සියලු පැතිවලින් විද්‍යාමානවන්නාසේ ජීවයේ සියලු විවිධත්වය සමග එහි සූක්ෂම සැලැස්මේ පුදුමය මෙන් යමක් මෙම අපූර්ව ග්‍රන්තය තුළ ඇති බැව් ප්‍රත්‍යක්ෂ කරගැනීමට යොමුවූවාවේ.

මැවීම, අභිප්‍රායක් සඳහා දෙවියන්වහන්සේ නොසාදන ලද බැව් නොසිතිය හැක. ආකාශයේ සහ පෘතුවියේ, මිනිසා තුළ සහ සියලු මැවීම තුළ ඇති සැලසුම් සහ ඥානවන්ත භාවය අප දැකීමේදී, මෙම පෘතුවිය මත ජීවිතයට අනාගත අභිප්‍රායක් තිබිය යුතුය.

එම අභිප්‍රාය බයිබලය එළිදරව් කරයි. එය මෙසේ ප්‍රකාශ කරයි: "මුළු පොළොව ස්වාමින්වහන්සේගේ තේජසෙන් පූර්ණකරනු ලබනවා සැබෑසේම..." (ගණන් කථාව 14:21). යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණිය යුත්තේ ඒ නිසාය, බයිබලය පැවතීමට පැමිණ ඇත්තේ ඒ නිසාය: මිනිසාට දෙවියන්වහන්සේගේ එළිදරව්ව ගෙනඒමටත්, ඔහු ගැළවීම සඳහා කැඳවීමටත්ය. ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනයේදී පෘතුවිය මත සදාකාල ජීවිතය එම ග්‍රන්ථය ඔබට පිළිගන්වයි. (රෝම 2:6-7; එළිදරව් 22:12; දානියෙල් 7:27).

ඔබ සඳහා වර්තමානයට පුදකලහැක්කේ කුමක්ද? මරණයෙන් අවසන්වන, කලකිරීම් සහ දුෂ්කරතාවයන් පිරි ජීවිතයකි! නමුත් අනාගතය සඳහා කුමක්ද? එය රඳාපවත්නේ ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ දෙවියන්වහන්සේ සමග කරන්නාවූ දෙය මතය! වර්තමානයේ පෘතුවිය මත පවතින්නාවූ දේ පිළිබඳ ඔබ

සැබවින්ම තෘප්තිමත්ද? පවුල් ගොඩනැගිය යුතු අනාගතය පිළිබඳ ඔබ ප්‍රීතිමත්ද? සියලු පැතිවලින් වර්ධනයවන්නාවූ දුෂ්ටභාවය ඔබට පැහැදිළිව දැකගත නොහැකිද? වැඩිවන්නාවූ දුරාචාරය? දැනටමත් මිනිස්වර්ගයා මුහුණදෙන දැවැන්ත ගැටළු?

මේ දේවල් සඳහා විසඳුම බයිබලය සතුය. දෙවියන්වහන්සේ සහ බයිබලය කෙරෙන් ඔවුන් පන්නා දමන්නට හැකි පීඩනයක් වර්තමානයේ ජනතාව මත ඇතිවූවද, මෙම බලපෑම් කෙරෙහි විරෝධය පෑමට පරයාප්ත කැපවීමක් සහ මානසික නිවහල්භාවයක් පෙන්වීමටත්, අමිල යහපතක්ම විය හැකි දේ අයැදිය යුතු බවත් නැනවත්භාවය ඔබට බලකර සිටී.

තීරණය ඔබ සතුය!

ලෝගෝස් ප්‍රකාශන (පී මැන්ස්ෆීල්ඩ් විසින් සංස්කරණය කරන ලදී).